සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

2413

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 03 යි |

නම / பெயர் / Name ....................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .......................

**උපදෙස් :**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

---

## I - කොටස

- පහත දැක්වෙන කවි, සින්දු හා ගීත ඇසුරෙන් අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A.
ඉතින් සැනසෙන්න - හොඳින් පුලුවන්නේ
දෙමව්පියො දෙන්න - ඇවිත් අර ඉන්නේ

B.
දෙමව්පියන් දූ දරුවන්
නාමෙට පින් පමුණුවන්න
මළගිය ඇත්තන් වෙනුවෙන්
පිනට මොකුත් මට ලැබෙන්න

C.
පරසක්වල අපෙ මහරජ්ජුරුවෝ තැගි කලයි කිරි පුස්සා
සරුබිම සොයලා කම්මැලිවීලා පැන්නුවයි කිරිපුස්සා
නිදැල්ලෙ වැඩිලා දැන් හොඳ කඩිසර කම්මැලි නැති කිරි පුස්සා

D.
මගෙ මන්ද්‍රි නම් බිසෝගේ - යාවඥාව බෝය වෙගේ
නෙක චණ්ඩ ව්‍යාඝ්‍රවාසී - හිමාල දේසේ දේවි

1. "රන්තලියේ කතාව" නමින් ගුවන් විදුලි නාට්‍යයක් ලෙස ප්‍රචාරය වූ, පසුව ජාතක කතා ශෛලියෙන් නිර්මාණය වූ නාට්‍යයට අදාළ වන්නේ,
   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

2. වෙස්සන්තර නූර්තියට අදාළ පද්‍ය වන්නේ,
   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

3. පරාක්‍රම නිරිඇල්ල නාට්‍යවේදියා විසින් රචිත නාට්‍යයකට අයත් පද්‍ය වන්නේ,
   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.



CamScanner

4. දයානන්ද ගුණවර්ධනයන් විසින් රචිත නාට්‍යයකට අයත් පද්‍ය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

5. කියවා සහ අසා රසවිඳීමට තිබෙන සිද්ධි මාලාවක් සහිත, ඇතැම් විට සංවාද ඇතුළත් දීර්ඝ කතා පුවත,
(1) නාට්‍යයකි. (2) කතන්දරයකි. (3) නර්තනයකි. (4) ගීත නාට්‍යයකි.

6. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස සැලකෙන කලාවන් ඇතුළත් වරණය තෝරන්න.
(1) මූර්ති, චිත්‍රපට, මුද්‍රා නාට්‍ය
(2) කැටයම්, චිත්‍ර, බැලේ
(3) චිත්‍රපට, බැලේ, ඔපෙරා
(4) කාටූන්, චිත්‍ර, ටෙලි නාට්‍ය

7. නාට්‍යයක් ප්‍රේක්ෂකයන් හමුවට ඉදිරිපත් කිරීමට යොදාගන්නා මාධ්‍ය වන්නේ කුමක් ද?
(1) සතර අභිනය
(2) ආනුෂංගික ශිල්ප භාවිතය
(3) කතා වින්‍යාසය
(4) පෙළ සාහිත්‍යය

8. ආනුෂංගික කලාවන් ඇතුළත් වරණය තෝරන්න.
(1) පෙළ රචනය, වේෂ භූෂණය, රංගාලෝකය
(2) නාට්‍ය සංගීතය, වේෂ භූෂණය, වේෂ නිරූපණය
(3) නර්තනය, රංගභූමි අලංකරණය, පාත්‍ර වර්ගයා
(4) පෙළ රචනය, පාත්‍ර වර්ගයා, අධ්‍යක්ෂවරයා

9. රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණයක් නොවන්නේ,
(1) රංග භූමිය සමතලා විය යුතුයි.
(2) රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබිය යුතුයි.
(3) රංග ශිල්පීන්ට අවශ්‍ය අවම පහසුකම් තිබිය යුතුයි.
(4) ප්‍රේක්ෂක පිරිසට විවිධ ස්ථානවල සිට නැරඹීමට හැකි වන පරිදි රංග භූමියේ හැඩය උස් පහත්ව පිහිටිය යුතු ය.

10. රංග භූමියේ මනඃකල්පිත බෙදීම වැදගත් වන්නේ කාහට ද?
(1) රංගන ශිල්පීන්ට හා වේදිකා පරිපාලකට
(2) ප්‍රේක්ෂකයන් හට හා රංගන ශිල්පීන්ට
(3) නාට්‍ය අධ්‍යක්ෂවරයාට හා වේදිකා පරිපාලකට
(4) රූපණ ශිල්පීන් හට හා නාට්‍ය අධ්‍යක්ෂවරයාට

11. එදිනෙදා ජීවිතයේ ආයාසයකින් තොරව අප විසින් කරනු ලබන චලන,
(1) නිර්මිත චලන වේ.
(2) ස්වභාවික චලන වේ.
(3) තාලානුකූල චලන වේ.
(4) මේ කිසිවක් නොවේ.

12. අංග රචනයේ දී රැවුල් සැකසීම සඳහා භාවිත කරන්නකි.
(1) පැන් කේක් (2) වූත් එනමල් (3) ක්‍රේප් හෙයාර් (4) නෝස් පොටි

13. නාට්‍යයක් හෝ වෙනත් සංදර්ශනයක් නැරඹීම සඳහා විශේෂයෙන් සූදානම් වී පැමිණෙන තැනැත්තා,
(1) නිෂ්පාදකයා ය. (2) රචකයා ය. (3) ශ්‍රාවකයා ය. (4) ප්‍රේක්ෂකයා ය.

14. වේදිකාව මත නාට්‍යයක් රංගගත කිරීමේ දී එය ඉදිරියට ගලායන්නේ,
(1) සංවාද මගිනි.
(2) රංග විධාන මගිනි.
(3) වේදිකා පරිපාලකගේ නියෝග මගිනි.
(4) ආනුෂංගික කලාවන් මගිනි.

15. "සෝබාව දේ මෙපුර සිරි විසිතුරු...." ගීතය ඇතුළත් වන්නේ,
(1) මනමේ නාට්‍යයේ ය.
(2) තාරාවෝ ඉගිලෙති නාට්‍යයේ ය.
(3) මූදු පුත්තු නාට්‍යයේ ය.
(4) බෙරහඬ නාට්‍යයේ ය.


CamScanner

16. රූපණ කාර්යයේ දී නළුවෙකු හට ඉතා වැදගත් චලන වර්ගය වන්නේ,
(1) ස්වභාවික චලන ය. (2) පරිකල්පන චලන ය. (3) නිර්මිත චලන ය. (4) තාලානුකූල චලන ය.

17. නාට්‍යමය අවස්ථාවක දැකිය නොහැකි ගුණාංගයක් වන්නේ,
(1) ගැටුම් සහිත අවස්ථා තිබීම
(2) කුතුහලාත්මක බවක් අන්තර්ගතව තිබීම
(3) චරිත ප්‍රශ්නයකට මුහුණ දී තිබීම
(4) චරිත ආරම්භයේ සිට අවසානය තෙක් සතුටින් සිටීම

18. චරිතයේ ස්වභාවය හා චරිතයේ ජීවගුණය ඉස්මතු කරලීමට ඉතා වැදගත් වන්නකි.
(1) නාට්‍ය පෙළ (2) සංවාද (3) රංග වින්‍යාසය (4) ප්‍රේක්ෂකයා

19. වේදිකාවේ දී ප්‍රේක්ෂකයා ඉදිරියේ මොහොතින් මොහොත මැවෙන දර්ශනය,
(1) ප්‍රේක්ෂාව නම් වේ. (2) රංග වින්‍යාසය නම් වේ.
(3) රූප රචනය නම් වේ. (4) පරිකල්පනය නම් වේ.

* පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 20 සිට 23 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | අනුවර්තනය/පරිවර්තනය | අනුවර්තක/පරිවර්තක |
|---|---|---|---|
| A | ජූලියස් හේ | තුරඟ සන්නිය | සුගතපාල ද සිල්වා |
| ඉක්නෙවිටා ඉ | B | බෙරහඬ | බන්දුල ජයවර්ධන |
| ද රයිවල්ස් | ෂෙරිඩන් | C | හෙන්රි ජයසේන |
| ද ජස්ට් | ඇල්බෙයා කැමූ | විනිශ්චය | D |

20. ඉහත වගුවේ A කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක්ද ?
(1) ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් (2) මරාසාද්
(3) ද ග්ලාස් මෙනාජරි (4) ද හෝස්

21. ඉහත වගුවේ B කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
(1) සොෆොක්ලීස් (2) එව්ගිනිෂ්වාත්ස් (3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (4) ඔස්කා වයිල්ඩ්

22. ඉහත වගුවේ C කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තනය / පරිවර්තනයේ නම කුමක්ද ?
(1) මකරා (2) මනාලයෝ (3) සුහ සහ යස (4) බෝඩිංකාරයෝ

23. ඉහත වගුවේ D කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තකගේ / පරිවර්තකගේ නම කුමක්ද ?
(1) සුගතපාල ද සිල්වා (2) හෙන්රි ජයසේන (3) සයිමන් නවගත්තේගම (4) පරාක්‍රම නිරිඇල්ල

24. පහත දැක්වෙන නාට්‍ය අතුරින් සංගීතය භාවිත නොවන වේදිකා නාට්‍ය කුමක් ද?
(1) ජනේලය (2) කැලණි පාලම (3) හුණුවටයේ කතාව (4) තාරාවෝ ඉගිලෙති

25. පහත දැක්වෙන නාට්‍ය අතුරින් නාට්‍යධර්මී ශෛලියෙන් නිෂ්පාදනය වූ නාට්‍ය නම් කරන්න.
(1) කැලණි පාලම (2) මූස (3) මෝදර මෝල (4) ලෝමහංස

26. දයානන්ද ගුණවර්ධනයන් විසින් ප්‍රථමවරට කැරකෙන වේදිකාව භාවිත කරනු ලැබූ නාට්‍ය කුමක් ද?
(1) බක්මහ අකුණු (2) පරාජය (3) ජසලෙන්චිනා (4) පිංගුත්තර

27. "මූදු පුත්තු" නම විශිෂ්ට නිර්මාණයට පාදක වූ යෙර්මා නාට්‍යයේ රචකයා වන්නේ,

(1) ඇන්ටන් චෙකොව් ය. (2) ගාර්ෂියා ලෝකා ය. (3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය. (4) ඔස්කා වයිල්ඩ් ය.

28. ගුණසේන ගලප්පත්ති විසින් පැරණි කවි නාඩගම් ශෛලියට අනුව නිෂ්පාදනය කළ නාට්‍ය වන්නේ,

(1) දේවතා එළිය. (2) දැස නිසා ය. (3) තාත්තා ය. (4) සඳකිඳුරු ය.

* පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් ප්‍රශ්න අංක 29 සිට 32 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A



B



C



D



E

29. රතු හැට්ටකාරි, මහාසාර නාට්‍ය සඳහා රංගන දායකත්වය ලබාදුන් ශිල්පියා/ශිල්පිණිය දැක්වෙන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

30. ලෝකධර්මී නාට්‍ය නිෂ්පාදනය ආරම්භ කළ ප්‍රමුඛ නාට්‍ය අධ්‍යක්ෂවරයා/අධ්‍යක්ෂවරිය වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

31. දෝන කතිරිනා, බර්නාඩාගේ සිපිරිගෙය නාට්‍යයන්හි සුවිශේෂී රංගනයක යෙදුනු රංගන ශිල්පියා/ශිල්පිණිය වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

32. ලංකාවේ නාට්‍ය කලාවේ සම්මත රංගන ක්‍රමය වෙනස් කරමින් ජනකරළිය ජංගම රහමඩල ආරම්භ කිරීමෙහිලා පුරෝගාමියෙකු වූයේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

33. නළුනිළියන්ගේ පවත්නා ස්වභාවය ඒ අයුරින් ම පෙන්වීම අංග රචනයේ දී හඳුන්වන්නේ,

(1) චරිතාංග අංග රචනය නමිනි. (2) සරල අංග රචනය නමිනි.

(3) ශෛලිගත අංග රචනය නමිනි. (4) මනඃකල්පිත අංග රචනය නමිනි.

34. අංග රචනයේ දී විවිධ හැඩ,රූප, වර්ණ මතු කිරීම සඳහා භාවිත කරනු ලබන්නේ කුමක් ද?

(1) වූත් එනමල් (2) පදනම් ආලේප (3) ලයිනින් කලර්ස් (4) නෝස්පොටි



CamScanner

* පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 35 සිට 37 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| ගඳුහ | දේවදූතයා | නාගසේන ස්ථවිර | හේමවත |
| සාතාගිර | සතිපිරිත | මිලිඳු රජු | යුගාසන බණ |

35. දොරකඩ අස්න නම් බෞද්ධ පූජාකර්මයට අයත් වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

36. ආලවක දමනය නම් පූජාකර්මයට අයත් චරිත දැක්වෙන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

37. මිලින්ද ප්‍රශ්නය නම් පූජාකර්මය දැක්වෙන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

38. නාට්‍ය අධ්‍යක්ෂණය සම්බන්ධව "සොඳුරු ආඥාදායකයා" නම් ශාස්ත්‍රීය ග්‍රන්ථය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(1) සුගතපාල ද සිල්වා (2) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
(3) හෙන්රි ජයසේන (4) රංජිත් ධර්මකීර්ති

39. මහාවංශයේ එන කතා පුවතක් ඇසුරු කොටගෙන සමකාලීන සමාජ දේශපාලනය විවර කරන සුභ සහ යස නාට්‍ය රචනා කරනු ලැබුවේ,

(1) සෝමලතා සුබසිංහ ය. (2) ගුණසේන ගලප්පත්ති ය.
(3) රංජිත් ධර්මකීර්ති ය. (4) සයිමන් නවගත්තේගම ය.

40. වේදිකාව, සිනමාව, රූපවාහිනිය සහ ගුවන්විදුලිය යන අංශ සඳහා රංගන දායකත්වය ලබාදුන් ප්‍රවීණ රංගන ශිල්පියා වන්නේ,

(1) හෙන්රි ජයසේන ය. (2) විජේරත්න වරකාගොඩ ය.
(3) ගාමිණී සමරකෝන් ය. (4) ගුණසේන ගලප්පත්ති ය.

CamScanner

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.**

01. දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
    i. දික්තල කාලගෝල නාට්‍යයේ නිෂ්පාදකවරයා නම් කරන්න. (ලකුණු 02)
    ii. මෙම නාට්‍යයේ පූර්ව රංගයේ එන චරිතය කුමක් ද? (ලකුණු 02)
    iii. දික්පිටියා පවසන පරිදි ගඟේ සිටින සත්ත්වයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)
    iv. "ආලේ බැන්ද මාගෙ රම්‍යවන්" ගීතය සඳහා සංගීතය සැපයීමට භාවිතා කළ නාඩගම් තාලය කුමක් ද? (ලකුණු 02)
    v. කාලගෝල විසින් දික්තලාගේ මුහුණ සමාන කරන්නේ කුමකට ද? (ලකුණු 02)
    vi. කාලගෝල විසින් මහෞෂධ පඬිතුමාගෙන් ඉල්ලා සිටින නියෝගය හා එම නියෝගයට මහෞෂධ පඬි විසින් දුන් පිළිතුර ලියා දක්වන්න. (ලකුණු 02)

(ලකුණු 02 ×6 = 12)

02. i. පහතරට ශාන්තිකර්ම සම්ප්‍රදායේ එන ප්‍රධාන ශාන්තිකර්ම 2ක් නම් කරන්න. (ලකුණු 02)
    ii. පහතරට ශාන්තිකර්මවල දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)
    iii. පහතරට ශාන්තිකර්මවල එන එක් නාට්‍යමය පෙළපාලියක් තෝරාගෙන, එහි ඉහත (ii) හි ඔබ දැක්වූ නාට්‍යමය ලක්‍ෂණ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

03. i. අංග රචනයේ දී වැදගත් වන මූලධර්මය කුමක් ද? (ලකුණු 02)
    ii. අංග රචනා ශිල්පියෙකු විසින් අංග රචනයේදී සැලකිලිමත් විය යුතු කරුණු 04ක් දක්වන්න. (ලකුණු 04)
    iii. අංග රචනයෙන් නාට්‍යයකට ඇති ප්‍රයෝජන පිළිබඳව නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

04. i. රංග භාණ්ඩ යනු කුමක් ද? (ලකුණු 02)
    ii. රංග භාණ්ඩ නිර්මාණය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය 04ක් ලියන්න. (ලකුණු 04)
    iii. රංග භාණ්ඩ නිර්මාණයේදී සැලකිලිමත් වියයුතු කරුණු පිළිබඳව ඔබ නැරඹූ නාට්‍ය ඇසුරින් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

05. i. ඔබ දන්නා රංග අභ්‍යාස 04ක් නම් කරන්න. (ලකුණු 02)
    ii. රංග අභ්‍යාසවල යෙදීමෙන් නළුවෙකුට ඇති ප්‍රයෝජන 04ක් ලියන්න. (ලකුණු 04)
    iii. ඔබ පංතිකාමරයේදී සිදු කරනු ලැබූ රංග අභ්‍යාසයක් ලියා දක්වන්න. (ලකුණු 06)

06. i. නෘත්ත යනු කුමක් ද? (ලකුණු 02)
    ii. නෘත්ත හා නෘත්‍ය එකිනෙකින් වෙනස්වන ආකාරය දක්වන්න. (ලකුණු 04)
    iii. "නාට්‍ය යනු බොහෝ කලා ශිල්පීන්ගේ සාමූහික ප්‍රයත්නයක මනා ප්‍රතිඵලයකි" විමසන්න. (ලකුණු 06)

07. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැක.
"මේ පාසල් නිවාඩු කාලයයි. කුමාරි, සීතා, අමර, කමල් මිතුරන් සිව්දෙනා එක්ව විද්‍යා පාඩමට අදාලව, නිවස අසල වනයේ සිදුවන ස්වභාවික සංසිද්ධීන් ගවේෂණය කිරීම සඳහා වනයට යති. කුරුළු කිචිබිචිය අතරේ වනයට ඇතුළුවන ඔවුන් දකින්නේ මලු හා පෙට්ටි කිහිපයක් ඔසවාගෙන වේගයෙන් වනය තුලට ඇවිද යන මිනිසුන් දෙදෙනෙකි."
    i. පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04)
    ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැඟීම සඳහා (ලකුණු 04)
    iii. කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04)



CamScanner


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න